

**‘මා නිවත්ත අභික්කම’ - නො නැවත ඉදිරියට යවු**



| | | |
|---|---|---|
| **58 වන කාණ්ඩය** | **බු.ව. 2559 බිනර මස පුරපසළොස්වක ද**<br>**ක්‍රි.ව. 2015 සැප්තැම්බර් මස 27 වන ද** | **05 වන කලඹ** |



# හැකි නම්.....



අඳුරේ ඇවිදින දනට
මුළා නො ව යනු පිණිස
පහන් ටැඹ විය හැකි නම් ඔබට.......

සංසාර ගිරි දුර්ග නඟින
සන්තාප ශෝක බර දනට
කුලුණු පොද විය හැකි නම් ඔබට.......

ද්වේෂයෙන් ඉරි තැළුණු හදට
සෙනෙහසේ දිය සිඳී ගිය කලට
දයාවේ චිළි දහර විය හැකි නම් ඔබට
සත්‍යයේ අබිරු හඬ විය හැකි ඔබට.........

**- අනඳ**



# ආර්යයා නම් කවරෙක් ද?

**60 වන ගුණ සමරුව වෙනුවෙනි.**

අතිපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහානායක
මාහිමිපාණන් වහන්සේ විසිනි.

බුදුන් දවසැ 'ආර්‍ය' නම් වූ බාලිසිකයෙක් (බිලි බාන්නෙක්) සිටියේ ය. ඔහු බිලියෙන් මසුන් මරමින් සිටි තැනට බුදුන් වහන්සේ වඩනා කලැ හේ බිලිපිත්ත පැත්තෙකැ දමා එකත්පස් වූ කලැ 'නුඹගේ නම කුමක් ද' යි අසා වදරා 'ආර්‍ය' යෙමැ යි කී කල්හි:

**"න තෙන අරියො හොති**
**යෙන පාණානි හිංසති**
**අහිංසා සබ්බපාණානං**
**අරියො'ති පවුච්චති"**

(= ඉන් අරී නම් නො වෙ
යමෙක් සතුන් පෙළා නම්
හැම සතුන් නොපෙළීමෙන්
අරී යැ යි කියනු ලැබේ.)

යැ යි වදළ සේක. මේ දේශනායෙන් අහිංසකයා ම 'ආර්යයා' බවත් හිංසකයා 'ම්ලේච්ඡයා' බවත් ප්‍රකාශ වේ. එහෙයින් ම අහිංසාව ආර්යාචාරය (=ශිෂ්ටාචාරය)

බවත්, හිංසාව ම්ලේච්ඡයන් ගේ තිරිසනුන් ගේ සිරිතක් බවත් ඔප්පු වේ. එසේ මැ යිඃ ලෝකයෙහි ශිෂ්ටාචාර යැ යි සම්මත වූ සියලු ම චාරිත්‍රයෝ අනුන් හට කරදරයක් පිළිකුලක් නො සතුටක් නොවන ලෙස යොදන ලද යහපත් පැවැතුම් වෙති. ශාසනයෙහි 'අනුන්' යනුවෙන් ගැනෙන්නේ මිනිසුන් පමණක් නො වැ කුරු කුහුඹු ආදී කුඩා සතුන් පටන් සියලු ම පණ ඇති සත්ත්ව වර්ගයා යි. එ බැවින් මිනිසුන් මිනිස් වූ හෝ තිරිසන් වූ හෝ යක් වූ පියස් වූ හෝ දෙව් බඹු වූ හෝ කවර සතකු වත් පෙළනුයේ වෙහෙසනුයේ මරනුයේ ම්ලේච්ඡයෙකි.

නො එසේ වූයේ ම ආර්යයෙකි (= උත්තමයෙකි. **"අවිහිංසා පරමො ධර්මඃ"** යී බාහ්‍ය පණ්ඩිතයෝ ද "අහිංසා යැ, දයා යැ, අනුකම්පා යැ, කරුණා යැ" යන මේ නම් වාච්‍යාර්ථ වශයෙන් - හෙවත් - ඒ ඒ නමින් කියැවෙන දෙයෙහි වශයෙන් සමාන වෙති.

"අහිංසා" යැ යි ඇසීමෙන් ම, සතුන් නො පෙළීම යැ යි හැඟෙතත්, 'පීඩාවට පත් සතුන් එයින් මුදා ගැනීම යැ' යනුත් එහි ව්‍යතිරෙක වශයෙන් ලැබෙන අර්ථය වේ. එබැවින්ඃ හැම සතුන් නොපෙළීමත්, දුකින් පෙළෙන සතුන් එයින් මුදා ගැනීමත්, 'අහිංසා' යැ යි දත යුතු. මීට ම සමානාර්ථ වූ **දයා ශබ්දය** රක්ෂාර්ථ වූ 'දය' - ධාතුයෙන් සිද්ධ බැවින් 'හැම සතුන් රැකැ බලා ගැනීම' =කාගෙත් දුකෙහි අන්තරායයෙහි සහාය වැ සැනැසිලි - සැලැසීම - යන අර්ථ ඇත්තේ වේ. මුළු සත්වග කෙරෙහි දයාපරභාවය නම් වූ අහිංසාව බෝසත් ගුණ අතුරෙන් මුල් ම ගුණය වේ. බුදු වූ පසුත්, උදයැ සවසැ දෙළොස් කෝටි ලක්ෂ වාරය බැගින් දිනපතා **මහා කරුණා**

සමාපත්තියට සමවැද එයින් නැගී "කවරකු හට කවර නම් වැඩක් සලසම් ද යි" බුදු ඇසින් බලා වදරා ඒ ඒ සත්නට ඒ ඒ යහපත සැලසීම **ප්‍රධාන බුද්ධකෘත්‍යය වේ.**

ඒ බැවින්, සියලු **බෞද්ධයන්** - තමන්ගේ ක්‍රියායෙකින් වත් කථායෙකින් වත් කිසි යම් මිනිසකු තබා කුරු කුහුඹුවකුට වත් පෙළීමක් දුක් වේදනාවක් පිළිකුලක් නොසතුටක් නො ඉපැදවියැ යුතු ය. දුකට පැමිණි ඒ හැම සතුන් ඒ ඒ දුකින් මුදා ගැනීමට (මඟ නො හැරැ) සහාය වියැ යුතු ය. එසේ කල්හි ම ශාස්තෘන් වහන්සේ අනුගමනය කළා නම් වේ.

අනා සින්ද වනගත් මිසදිටු නපු රූ
දනා කැන්ද වා තෙපලින් තිලොවැ'දු රූ
මනා නන්ද ගිය මඟ දැක්වූ මහ රූ
ගුණා නන්ද හිමිපාණනි ! වදනිසු රූ

ඇස් අට අසුන වැඩහිඳ දම් දෙසන මෙනේ
ගොස් බඹ ලොවට විසිතුරු සුර පෙරහ රිනේ
තිස් අට වසක් ඉක්මව ගිය නමුත් අනේ
විස්මෙකි තවම ඔබෙ රුව අප හදෙහි පෙනේ

**ටිබෙට් ජාතික**
**එස්. මහින්ද හිමි**



# පරවැඩ කිරීම කාටත් කළ හැකිය

**අතිපූජ්‍ය පැළෑණේ මහානායක මාහිමියන් වහන්සේ විසිනි.**

තමාගේ ජීවිතය කවර ලෙසකින් වත් අනුන් හට කරදරයට හේතු නොවන පරිදි පැවැත්වීම හෙවත් වෙන යහපතක් නො කට හැකි නම් අනුන් හට අයහපතක් ගැහැටක් නොකොට කල් යැවීම පළමුවන පරාර්ථචර්යාව බව සිතාගත යුතු ය. ඉන්පසු පරවැඩ සැලසිය හැකි වන්නේ ධනවතුන් විසින් ම යයි නො සිතිය යුතු ය. ධනවතුන් විසින් අසරණයනට උපභෝග පරිභෝග වස්තුයෙන් කැරෙන සංග්‍රහයටත් වැඩි තරම් වූ යහපත ගුණවතුන් විසින් අවවාදනුශාසන දනයෙන් ද, උගතුන් විසින් නූගත් සිසුන් උගන්වා ලීමෙන් ද, තපස්වීන් විසින් ධර්මාවවාදයෙන් දුර්දාන්තයන් හික්මවා ලීමෙන් ද, බලවතුන් විසින් දුබලයනට වතාවත් (සාත්තු සප්පායම්) සැලැසීමෙන් දැයි යන ආදී වශයෙන් හැම දෙනාට ම තම තමා වෙත තිබෙන යම් දෙයකින් කල් යල් බලා සැලැසිය හැකි ය. ධන ව්‍යයෙන් කැරෙන උපකාරය ම මහත් දෙය කොට සැලැකෙන්නේ අප රට දැන් පවත්නා දුගී බව නිසා සාමාන්‍ය ජනයාගේ හැඟීම් දීන තත්ත්වයට බැස තිබෙන නිසා ය.

තමන්ගේ වැඩ වත් සලසා ගත නොහෙන බැගෑ තත්ත්වයෙකැ සිටිනුවන් විසින් කෙසේ පරවැඩ සැලැසිය හැකිද්ද යි ඇසිය හැකි ය. එයට පිළිතුරු නම් තමන්ගේ වැඩෙහි යෙදෙන ගමනේ එය ම පර වැඩට සරිලන ලෙස සුදුසු අතට යොමු කිරීම ය යනු යි. පාඨශාලාචාර්යවරයෙක් ජීවිකාවක් සැටියට ඉගැන්වීම කෙරෙයි. ඉදින් ඔහු නීත්‍යනුකූල වැ පඩියට සරිලන මෙහෙය කුලියට කොට පිරිමසාලීමෙන් නො නැවතී “මේ මෙහෙයෙන් මට බාල පරම්පරාවට අභිවෘද්ධියක් සැලසිය හැකි නම් එය කරන්නෙමැ”යි ඉටාගෙන හැමකල්හි අවංක වැ එසේ ක්‍රියා කළ හොත් ඒ ජීවිකායෙන් ආත්මාර්ථයත් සමඟ ම පරවැඩ ද සැලැසේ. රාජ කාර්යයන් හා වෙනත් කාර්යයන්හි යෙදී දිවි පෙවෙත් කරන කවුරුන් විසිනුත් මෙසේ අවංකවූ සත්පුරුෂ පෙවෙත් කරන කවුරුන් විසිනුත් මෙසේ අවංක වූ ස්තපුරුෂ ගුණය ඇතහොත් තමන් තමන්ගේ කාර්යය කරන ගමනේ ම මහා ජනයාට ඒ කාර්යයෙන් ම උපකාරී විය හැකි ය.

**අප්පස්සුතා'යං පුරිසෝ - බලිවද්දෝ'ව ජීරති**
**මංසානි තස්ස වඩ්ඪන්ති - පඤ්ඤා තස්ස න වඩ්ඪති**

ඇසූ පිරූ තැන් නැතියෙ - ගොනෙකු මෙන් ජරපත් වේ
ඔහු ඇඟ මස් මතු වැඩේ - නුවණෙක් නම් නොම වැඩේ....



# මොහොට්ටිවත්තේ වාදීභසිංහයාණෝ

**125 වන ගුණ සමරුව නිමිත්තෙනි.**

සිරි වජිරාරාමාධිකාරීව වැඩ විසූ
අතිපූජ්‍ය පියදස්සි නාහිමිපාණෝ.

පෙර අපර දෙදිග ම රටවල ඒ ඒ කාලවලදී, ඒ ඒ යුගවලදී දියුණුවත් පිරිහීමත් සිදු වුණු සැටි ලෝක ඉතිහාසය හෙළි කරයි. ඉතිහාසය යනු අනිත්‍ය වාර්තාවෙකි. විපරිණාමය පිළිබඳ කදිම චිත්‍රයෙකි. අපගේ මේ හෙළදිව, ශ්‍රී ලංකාව, ප්‍රාග් බෞද්ධ සමයේ සිට අද දක්වා නොයෙක් විපරිණාමයනට බඳුන් වූ සැටි ගිය කල් පෙරළා බලන විට දැක්ක හැකි ය.

සේන ගුත්තික රජ සමයේ ජාතියටත් බුදු සමයටත් පහර එල්ල වුණු සැටි, මහසෙන් රජු දවස පන්සල්, වෙහෙර විහාර 367 ක් පොළොවට ම සමතලා කැරුණු සැටි, රුවන්වැලි සෑය වටේ උඳු වැපුරුණු සැටි, පිඬු පිණිස ගිය භික්ෂු නමකට පිණ්ඩපාතය පිළිගැන්වීම දඬුවම් ලැබිය යුතු වරදක් වුණු සැටි වංස කථාවලින් හෙළි වෙයි. එළාර රජ සමය ද අවුරුදු සතළිස් සතර දක්වා දික් විය. එහෙත් ජාතියවත් බුදු සමයවත් කිසිවකුට නසන්නට, වනසන්නට නොහැකි විය.

## විජාතික ආක්‍රමණය

අමුතු ම ශිෂ්ටාචාරයකට සභ්‍යත්වයකට, හිමිකම් ඇති ව සිටි, අවරදිගින් ආ පෘතුගීසීන් ද ඕලන්දයන් හා ඉංග්‍රීසින් ද බලහත්කාරයෙන් මේ හෙළ රට ආක්‍රමණය කොට දුරදිග නො බලා නිර්දය ව කළ කී දැයින් හෙළයන් ගේ ජාතික වූ ද, ආගමික වූ ද, දේශීය වූ ද, සිරිත් විරිත් හා ගති පැවැතුම් ද බෞද්ධ අධ්‍යාපනය ද පිරිහී ගියහ. එකල විදේශීය මිෂනාරිවරුන් ගේ දඩබිමක් වූ මේ හෙළදිවැ වැස්සන් හට එකල පැවැතුණු ඉංග්‍රීසි රජයෙනුදු පිහිටක්, හව්හරණයක් නැති ව විජාතීය දැයට ඇබ්බැහි වෙමින්, බෞද්ධ පරිසරයෙන්, බොදු හැදියාවෙන් ඈත් ව කල් ගෙවන්නට සිදුවිය.

එදා මේ උෂ්ණාධික ශ්‍රී ලංකාවේත් උස් තොප්පියත් වල්ගා කබායත් නැති ව ජන සමාජයේ කෙනෙකුගේ තත්ත්වය රැකුණේ නැත. ක්‍රිස්තියානි පල්ලියේදී ක්‍රිස්තු පූජකයකු ගේ ආශීර්වාදය ලබාගෙන කළ විවාහය ම හරි ගිය ම විවාහය විය. ෂැම්පේන් හෝ විස්කි සහිත ව"සච්දිය පිරීමක් " නොවිණි නම් අළුත විවාහ වූ දම්පතීන්ගේ ඒ විවා මගුල අංග සම්පූර්ණ එකක් නො වී ය. විනිශ්චය ශාලාවකදී තම සත්‍යතාව සහතික කිරීම වශයෙන් බයිබලය සිඹින්නේ නැති ව බෞද්ධයන්හට සාක්ෂ්‍ය දීමෙක් නො වී ය.

අවුරුදු තුන්සිය පණහකට වැඩි කලක් අපි මෙසේ ගැහැට වින්දෙමු. මෙතරම් දිගු කලක් විදෙසින්ගෙන් හිරිහැර, තාඩන ලත් බෞද්ධ රටක් ලංකාව හැර වෙන

නැත. ඒ අඳුරු යුගවලදී වැලිවිට සිරි සරණංකර සංඝරාජ, අඹගහපිටියේ සිරි ඤාණවිමලතිස්ස, අත්තුඩාවේ සිරි ධම්මරක්ඛිත, අඹගහවත්තේ සිරි ඉන්ද්‍රසභවර ඤාණසාමි යන මේ පැවිදි උතුමන් ද, මෑත කාලයේ දී මොහොට්ටිවත්තේ ගුණානන්ද හිමි, අනගාරික ධර්මපාල, වලිසිංහ හරිශ්චන්ද්‍ර ආදී වීරවරයන් ද ඉදිරිපත් ව රට, දැය, සමය වෙනුවෙන් අහිංසාවාදී සටනක් ගෙනගිය සැටි ප්‍රකට ය. අපගේ වාදීභසිංහයාණන්හට මේ ජාතික පරිහානිය, මේ ආගමික පරිහානිය සක්සුදක් සේ පෙනී ගියේ ය.

## කවුද මේ වාදීභසිංහයාණෝ ?

දක්ෂිණ ලංකාවේ බළපිටිය නම් ගමෙහි වුසූ ගිංගම ලද්දු අසනේරිස් මැන්දිස් සහ කළුදුර මල්දෝ ද සිල්වා යන දම්පතීන් හට 1823 නේ පෙබරවාරි 9 වන ද පින්වත් වීර දරුවෙක් ලැබුණි. ඒ දරුවා හැඳින්වූයේ ගිංගම ලද්දු මිගෙල් මැන්දිස් යන නමිනි. මූලික අධ්‍යාපනය (පන්සල් අධ්‍යාපනය) ලබා ගත් මැන්දිස් දිගු කලක් ගිහි ජීවිතයේ රැඳුණේ නැත. බලපිටියේ පූජ්‍ය ගුණරතන හිමිපාණන් උපාධ්‍යාය කොට ගෙන පැවිදි විය. ඉන්පසු 'මොහොට්ටිවත්තේ (මිගෙට්ටුවත්තේ) ගුණානන්ද' යන පැවිදි නමින් ප්‍රකට විය.

ධර්ම ශාස්ත්‍රීය කරුණු උගන්නා ගමනේ ක්‍රිස්තු ධර්මය ගැන ද දැනීමක් මේ තෙරපාණන් ලබා ගත්තේ අනාගතයේදී ඒ දැනීම අත්‍යවශ්‍ය බව දැන සිටි හෙයිනැයි සිතාගත හැකි ය. එද ක්‍රිස්තු පූජක පක්ෂය බුදු සමයට

එරෙහි ව කථා කෙරෙමින් පහර දෙන්නට සූදනම් වුණු හැටි දුටු ගුණානන්ද ස්වාමීන් වහන්සේ ගිහි පැවිදි හැම බෞද්ධයන් වෙනුවෙන් නිර්භය ව, අදීන ව ඉදිරියට අවුත් වාදභිමුඛ ව සටන ආරම්භ කළහ. හික්කඩුවේ සිරි සුමංගල නායක හිමිපාණන් ප්‍රධාන උගත්, වියත්, පැවිදි පිරිස වාදයට අයත් කරුණු සපයා දුන්හ.

## ඕල්කට් සෙන්පති පැමිණෙයි

එසේ පැවැත්වුණු වාද අතර පාණදුරා වාදයට ලැබුණේ උසස් තැනෙකි. එහි රාවය මූදෙන් එතෙරට ද ගියේ ය. මේ වාදය පිළිබඳ ව එකල තුබුණු ඉංග්‍රීසි පුවත්පත්වල ද පළවිය. ආචාර්ය ජේ.එම්. පීබල්ස් විසින් ලියන ලද මේ බෞද්ධ - ක්‍රිස්තු විවාද වාර්තාව කියවා බුදු දහම කෙරෙහි ලැදියාවක් ඇති කැරගත් වීරයකුට මේ හෙළදිවත් එහි වූ වාදීභසිංහයාත් දැක ගැනීමට නොමැඬලිය හැකි කුතුහලයෙක් ඇති විය. හේ අනෙකකු නො ව, ඇමෙරිකානු එක්සත් ජනපදයේ නිව්ජර්සී ප්‍රාන්තයේ, ඔරේන්ජ් නමැති ග්‍රාමවරයෙහි 1831 අගෝසතු 2 වැනි දින මෙලොව එළිය දුටු ඇමරිකන් ජාතික හෙන්රි ස්ටීල් ඕල්කට් සෙන්පතියා ය.

තමනට හමුවන දිනයේ මිත්‍රත්වයක් ඇති කැරගත් රුසියන් ජාතික හෙලේනා පෙට්රොව්නා බ්ලවෙට්ස්කි මැතිනිය ගේ සහායලත් ඕල්කට් සෙන්පති, නිව්යෝක් නගරයේ පළමුවරට තිඔසොපි (දිව්‍යමය ස්ථානය) නමින් සමාගමක් ආරම්භ කොට ඒ පිළිබඳ ප්‍රථම දේශනාව 1875 නොවැම්බර් 17 වැනි ද පැවැත්විය."බ්ලවෙට්ස්කි

මැතිනිය තිඔසොපි වාදය ද, ඕල්කට්තුමා ඒ පිළිබඳ සමාගම් ද ලොවට දුන්නාහ" යනු ඒ තිඔසොපි වාදයේ පුරිගාමී වූ ඉංග්‍රීසි ජාතික ඇනීබෙසන්ට් මැතිනිය ගේ වචන යි.

දුන් ඕල්කට් - බ්ලවෙට්ස්කි දෙපොළගේ නෙත්සිත් යොමුවූයේ "ඉන්දියන් සාගරයේ මුතු ඇටය" වූ මනෝරම්‍ය ශ්‍රී ලංකාව දෙසට ය. 1880 මැයි 17 වැනිදා මෙදින වෙසක් පුණු පෝය දින බව ඕල්කට් දින පොතෙහි සඳහන් වේ. දෙදෙන ගාලු වරායෙන් මෙලකට ගොඩබැස විජයානන්ද විහාරයට ගොස් අක්මීමන ධම්මාරාම හිමිපාණන් ඉදිරියෙහි තිසරණ සහිත පන්සිල් සමාදන් ව තමන් බෞද්ධයන් බව හෙළි කළහ. ඉන්පසු ඕල්කට්තුමා හෙළයන් ගේ ජාතික, ආගමික හා ආධ්‍යාපනික උන්නතිය සඳහා කළ සේවාව විස්තර කිරීමට මේ නොතැනි. සියලු යහපතට මුල්වූයේ අපගේ වාදීභසිංහයාණන් ගේ ව්‍යක්ත, විශාරද දේශනා බව අවිවාදයෙන් පිළිගත යුතු ය.

ගුණානන්ද මාහිමියන් කෙරෙහි දැඩි පහන් සිතින් යුතු ව සිටි ඕල්කට්තුමා එදා පිටකොටුවේ බෞද්ධ ඉංග්‍රිසි පාසලටද "ගුණානන්ද විදුහල" යන නම දෙන්නට උනන්දු වූ නමුත් ගුණානන්ද මාහිමිපාණන් එයට නො කැමති වූයෙන් දෙවන වරට ඊට නම් තබද්දී ගුණානන්ද යන නමින් අඩක් ගෙන "ආනන්ද" යන නම යෙදූ බවත් පැවසේ.



# දුක සහ සැප

මුතු සීයා විසිනි

ආදරණීය දුවේ! පුතේ! ඔබ ගේ වැඩිහිටියකු හෝ නෑදෑයකු හෝ නිවසට ගොඩ වැදුණා ම පළමුවෙන් ම ඔබලා ගෙන් අහන්නේ "කොහොමද දරුවනේ දුක්සැප?" කියා ය. වැඩිහිටියන් එකිනෙකා හමු වූ විටත් ඔවුන් ගේ කතාව අරඹන්නේ "හා ඉතින් කොහොමද දුක්සැප ? " යනුවෙනි.

අප කුඩා අවධියේ දී තිරගත වූ මුල් ම සිංහල චිත්‍රපටියක් වන අශෝකමාලාවෙහි සම්මානණීය ගායක අමරදේවයන් තවුස් වෙස් ගෙන කැළයෙහි සැරිසරන්නේ, "**දුක සැප නිති පෙරළේ - රියසක ලෙස ලෝකේ**"යන ගීතය ගයමිනි.

තොටගමුවේ සිරි රහල් හිමියන් ගේ කුඩා අවධිය හා සබැඳි ජනකවියක ද මෙසේ කියවේ-

"මා වැනි බිළින්දා - වර වර ළඟට කැන්දා
දුක්සැප කුමන්දා-අසන නිරිඳෝ වෙන කොයින්දා"

දුක සහ සැප යන ලක්ෂණ දෙක කෙරෙහි අප සාමාන්‍ය ජීවිතයේ දී  අවධානය දක්වන බව ඉහත දක්වා ඇති නිදසුන්වලින් පැහැදිලි වෙයි . එසේ ම ධර්මානුකූල ව ජීවිතය කෙරෙහි ගැඹුරින් සලකා බලන විට ද අප ගේ කෙළවරක් නැති සංසාර ගමනට හේතු වී ඇත්තේ මේ දුකසැප පිළිබඳ සංකල්පය බව පැහැදිලි වෙයි.

ජීවිතය දුකයැ යි සැලකූ එක්තරා පිරිවැජි තවුස් පිරිසක් දුක කෙළවර කළ හැක්කේ දැඩි ලෙස දුක්විඳීමෙන් ම යයි යන මිථ්‍යා මතය දරමින් සිරුරට දැඩි ලෙස දුක් දෙමින් තවුස්දම් රකිමින් දුකකෙළවර කිරීමට යත්න දැරූහ. සත්‍ය ගවේෂණයෙහි යෙදුණු ගෞතම බෝධිසත්වයෝ ද එවැනි වූ පස්වග තවුසන් සමගින් සයඅවුරුද්දක් දුෂ්කර ක්‍රියා කොට පසුව එහි නිසරු බව ප්‍රත්‍යක්ෂ කර ගත්හ. සිරුරට අධික ලෙස දුක් දීම අත්හළ ගෞතමයන් වහන්සේ බුද්ධත්වය ලැබීමෙන් අනතුරු ව එම පස්වග තවුසනට වදාළ පළමු ධර්ම දේශනය වන දම්සක් පැවතුම් සූත්‍රයෙහි පැවිද්දන් විසින් අත්හළයුතු අත්තකිලමථානුයෝගය නම් අන්තය වශයෙන් එය දැක්වූහ. එම සූත්‍රයෙහි  ම සඳහන් කර ඇති අනෙක් පිළිවෙත වූයේ  කාමසුඛල්ලිකානුයෝගයයි.

ඒ පරලොවක් ගැන විශ්වාසයක් නොතබා අධික ලෙස සැප විඳීම ය.  බුදුන් වහන්සේ විසින් පස්වග තවුසනට දුක් නැති කිරීමේ මාර්ගය වශයෙන් චතුරාර්ය සත්‍යය විස්තර  කිරීමේ දී දුකත් දුකට හේතුවත් දුක නැති  කිරීමත් දුක නැති  කිරීමේ මාර්ගයත් පැහැදිලිව පෙන්වා දී ඇති නිසා බුදු දහමෙහි ආගමික ජීවිතයේ

ගෘහස්ථයනට ඉඩක් නැතැයි සැකයෙක් එකල පහළ විණ. ඒ අනුව එකලැ විසූ වච්ඡගොත්ත නම් පිරිවැජියෙක් ඒ පිළිබඳව බුදුන් වහන්සේ විමසී ය. එයට පිළිතුරු ලෙස උන් වහන්සේ පැවසුවේ ගිහියනට එම අත්බැව්හි දී ම කුශලයන්හි යෙදීමෙන් සෝවාන් සකෘදාගාමී ආදී මාර්ග ඵලත් අනගාරික ව බ්‍රහ්මචාරී වීමෙන් අනාගාමී ඵලයත් ලද හැකි බවත් ය.

ඒ අනුව තම සංසාරික විමුක්තිය උදෙසා ගිහියකු වශයෙන් සැපවත් ජීවිතයක් ගත කරමින් ම පින්දහම් කළ හැකි බැව් පැහැදිලි ය. ඒ අතර මිනිස් ලොව උපත ලබන සත්වයකු ට ම එම අත්බැව්හි දී සැපවත් ජීවිතයක් ගත කිරීමට ද අවශ්‍ය පසුබිම සකස් කර ගත හැකි අයුරු ගිහිවිනය ලෙස නම් කර ඇති සිගාලොවාද, ව්‍යග්ඝපජ්ජ, වසල හා පරාභව සූත්‍රයන්හි දක්වා ඇත. (එය වෙනම ම සාකච්ඡා කළ යුතු වූ මාතෘකාවකි)

අංගුත්තර නිකායේ **අණන සූත්‍රයෙහි** ද සාර්ථක සැපවත් ජීවිතයක හිමි කරුවකු වන්නට නම් තම ජීවිතය අංග සතරකින් සමන්විත කර ගත යුතු බව දක්වා ඇත. ඒවා නම්

1. **අත්ථි සුඛ-** තමන් අපේක්‍ෂා කරන පරිදි ජීවිතය පවත්වා ගෙන යෑමට අවශ්‍ය දෑ තමන් සතුව තිබීමයි.

2. **භෝග සුඛ-** තමන් සතුව ඇති ඒ ධනධාන්‍යාදිය තම දරුමල්ලන් නෑදෑහිතවතුන් සමඟ බෙදා හදාගෙන භුක්ති විඳීමේ සතුටයි.

3. **අණන සුඛ** - තමන් සතුව ඇති එම සම්පත් රැස් කිරීමේදී කිසිවකුටත් ණය නොවීම නිසා ලබන සතුටයි.

4. **අනවජ්ජ සුඛ**- තමන් සතු සියලු සම්පත් රැස් කිරීමේ දී සාධාරණ ව වැරදි මිණුම් කිරුම් නොයොදා තහනම් වෙළෙඳාම්හි නොයෙදී ධාර්මික වීමෙන් ලබන සතුටයි.

දරුවනේ, ධර්ම දේශනයක් අවසානයේ දී ඔබ අප සැමට වැඳ ගන්නය කියා ධර්ම දේශකයන් වහන්සේ ගාථාවක් කියනවා අසා තියෙනවා නේද? **අභිවාදන සීලිස්ස** ආදී වශයෙන් ඇරඹෙන එම ගාථාවෙහි සාමාන්‍ය අදහස වනුයේ වැඩිහිටියනට නමස්කාර කිරීමෙන් එම තැනැත්තා තුළ සැපවත් ජීවිතයකට අදාළ වන ධර්ම හතරක් (පහක්) වැඩෙන බවයි. ඒ පහ නම් ආයු වර්ණ සැප බල සහ ප්‍රඥාව යි. මනුෂ්‍යයකුට සැපවත් ජීවිතයක් ගත කරන්නට අවශ්‍ය වන්නේ ද මෙම අංග පහයි. ඔබ මේ අත්බැව්හි දී මේ ගුණාගයන් ගෙන් යුක්ත නම්, ඒ පෙර අත්බැව්හි දී කරන ලද කුසල් හේතුවෙනි. ඉදිරියට ද සසර වසන තුරු මේ වාසනාව ලැබීමට නිරතුරුව ම දානශීලාදීපින්කම්හි යෙදිය යුතු ය. මේ ලිපිය අවසන් කරන්නට මත්තෙන් ඛුද්දක නිකායේ ධම්ම පදයේ සුඛ වග්ගයෙන් හා බුද්ධවග්ගයෙන් ගාථා දෙකක් උපුටා දක්වමි.

(1) **ආරෝග්‍ය පරමා ලාභා**
**සන්තුට්ඨී පරමං ධනං**
**විස්සාසා පරමා ඤාතී**
**නිබ්බානං පරමං සුඛං** (සුඛ වග්ග-204)

**සාමාන්‍ය අර්ථය**

නිරෝගී බව උතුම් සැපතයි. ලද දෙයින් සතුටු වීම උතුම් ධනයයි . විශ්වාසවන්තයෝ පරම ඤාතීහු වෙති. මේ සැමට වඩා නිර්වානය උතුම් වෙයි .

(2) **සුඛෝ බුද්ධානං උප්පාදෝ**
**සුඛා සද්ධම්ම දේසනා**
**සුඛා සංඝස්ස සාමග්ගී**
**සමග්ගානං තපො සුඛෝ** (බුද්ධ වග්ග - 194)

**සාමාන්‍ය අර්ථය**

බුදුවරයන් ගේ උපත ලොවට සැපතකි. සදහම් දෙසීම (ඇසීමට ලැබීම) ද සැපතෙකි. සංඝයාගේ සමගිය සැපතෙකි. සමගියෙන් කල් යවන්නන් ගේ තපස සැපයෙකි.

තෙරුවන් සරණයි !!



# විදුරුනැණ විදුරු මිණි පහන

(පරමපූජ්‍ය පැළෑණේ සිරි වජිරඤාණ මහානායක මාහිමිපාණන්ගේ 60 වන සමරුව නිමිත්තෙන්)

සිරි වජිරාරාම දහම් පාසලේ නියෝජ්‍ය ප්‍රධානාචාර්ය
ශාස්ත්‍රපති මීගොඩ සුබිත හිමිපාණන් විසිනි

දැයේත් සසුනේත් ඉතාම දුබග කාල අන්තරයන්හිදී කලින් කලට පහළ වූ මහා පුරුෂයෝ ඒ ඊශ්වර විංසති සමය බ්‍රහ්ම විංසති සමයක් කළෝය. බුද්ධඝෝෂ මාහිමියන් වහන්සේ, වැලිවිට සරණංකර සංඝරාජයන් වහන්සේ වැනි මහෝත්තමයන් වහන්සේලා ඒ ඒ යුගයන්හි පහළව තමන් වහන්සේලාගේ යුග කාර්ය ඉටුකොට වැඩි සේක. ඒ සඟ පෙළපතෙහි විසිවන සියවස ශෝභාවත් කළ උතුමන් වහන්සේ නමකි පැළෑණේ සිරි වජිරඤාණ මහානායක මාහිමියන් වහන්සේ.

රාජ්‍ය තන්ත්‍රය හා දහම දැඩිව බැඳුණු රටක රාජ්‍ය තන්ත්‍රයේ ප්‍රබල බිඳවැටීම් සිදුවන විට ඒ හා සසුනේද ප්‍රබල පරිහානියක් සිදුවීම ස්වාභාවික සංසිද්ධියකි. දහසය වන සියවසින් පසු ඇතිවූ සතුරු බලපෑම් හේතුවෙන් ලංකා සමාජය නොයෙකුත් ව්‍යසනවලට පත්වීමත් මහා විහාරය විනාශ වීමත් නිසා සංඝ ශාසනය නැතිව ගොස් උපසම්පදා භික්ෂූන් නැති තත්වයක් උදා විය. සිල්වත්

සමාගම බිහිකරමින් වැලිවිට සරණංකර සාමණේරයන් වහන්සේ උපසම්පදාව ස්ථාපනය කිරීම සඳහා ප්‍රබෝධයක් ඇති කළ අතර ක්‍රි. ව. 1753 දී යළි උපසම්පදාව පිහිටුවීම මෙරට ශාසන සම්ප්‍රදායේ අද්විතීය අවස්ථාවක් විය. එහි ඊළඟ පියවර ලෙසින් දකුණේ අමරපුර නිකාය හා රාමඤ්ඤ නිකාය බිහිවිය. උඩරට ස්ථාපිත සංඝ සසුන විසින්, සම්ප්‍රදාය සුරක්ෂිත කරද්දී නිරිත දිගින් බිහිවූ ශාසනික ව්‍යාපාරය නව මඟක් ගත්තේ ය. නව ලෝකය හා සම්බන්ධතා පැවැත්වීමේ හැකියාව තිබූ මේ භූමියේ සිටියවුන් නව ලෝක තත්ත්වයන් හඳුනා ගනිමින් සිය ජාතික ව්‍යාපාරය මෙහෙය වී ය.

මෙහි එක් සන්ධිස්ථානයක් වූයේ ඉංග්‍රීසි අධිරාජ්‍යයේ දර්ශනය වූ කිතුනු දහමට එරෙහිව ඍජු මතවාදී අරගලයක් ආරම්භ කළ බෞද්ධ භික්ෂුව කිතුනුවන් සමඟ කළ විවාදයන්ගෙන් ජයග්‍රහණය ලැබීම යි. මෙහි දී මතවාදීව බිඳ වැටුණේ හිරු නොබසින අධිරාජ්‍යයේ චින්තනය හා දර්ශනය යි. ඕල්කට්තුමාගේ පැමිණීම හා ධර්මපාලතුමාගේ නැඟීම ආදී කේන්ද්‍රීය සංසිද්ධීන් මේ හා සමකාලීනව සිදුවිය. කොළඹ නගරය කේන්ද්‍ර කොට ගත් තදාසන්න සමාජයේ විශාල ජාතික හා ශාසනික අවපාතයක ලකුණු මෙකල ප්‍රකට වන්නට විය. වෙසෙසින්ම ඉංග්‍රීසි ආණ්ඩුවේ නිලධාරීන්ගෙන් වරප්‍රසාද හා තනතුරු ලාභයන් උදෙසා කොළඹ ප්‍රභූ පන්තිය ශීඝ්‍රයෙන් අන්‍යාගමික කරණය වෙමින් පැවති අතර මුළුමනින්ම බටහිර අනුකාරකවාදී ජීවන රටාවකට පරිවර්තනය වෙමින් තිබිණි. මෙතෙක් කුලය ප්‍රධාන

කොටගෙන මෙහෙයැවුණු සිංහල සමාජ සංස්ථාව වෙනුවට මුදල ප්‍රමුඛ කොට මෙහෙයවෙන සමාජයක ලකුණු පහළ වෙමින් තිබිණි. මීට සියවස් එකහමාරකට පෙර සරණංකර සංඝරාජයන් වහන්සේ උඩරට ප්‍රභූ පන්තිය කේන්ද්‍ර කොට ගෙන ඇති කළ ශාසන නවෝදය මේ වන විට ශාඛා ප්‍රශාඛා පැතිර යමින් තිබූ නමුත් එහි නව ප්‍රවණතාවයක අවශ්‍යතාවයද මේ වන විට පැනෙමින් තිබිණි. අනාගතයෙහි වඩා බලවත් වන්නේ මෙම නැගෙමින් පැවති නව අර්ථපති පිරිස බව දුටු පැළෑණේ මහ නා හිමියෝ ඔවුන් අන්‍යාගමික වීම විශාල ශාසනික අනතුරක් සේ දුටහ.

ජාතික වශයෙන් උදාවෙමින් තිබූ දුර්භාග්‍ය සම්පන්න වටපිටාව නිසා උගත් භික්ෂූන් ජාතික අවශ්‍යතා සඳහා සිය ජීවිතයේ වැඩි කොටස මිඩංගු කළ අතර ඉතිරි වූ ගම් දනව් වැසි ඇතැම් භික්ෂූහු ඉංග්‍රීසි ආණ්ඩුවට හිතෛෂීව බාධා විරහිතව සුවසේ කල් යැවීමට සිතුවෝය. මෙම අඳුරු කාල ප්‍රාන්තරයෙහි යට යෙමින් පැවති පිළිවෙත් සසුන යළි නඟා සිටවීමටත් එම අකලංක ශාසන ප්‍රයත්නය මඟින් පන්සලෙන් ඈත් මෑත් වෙමින් සිටි කොළඹ කේන්ද්‍ර කොටගත් ප්‍රභූ පිරිස, රාජ්‍ය නිලධාරීන්, නව අර්ථපති පෙළ, උගතුන් බුද්ධිමතුන් සේ ම සරණක් සොයමින් සිටි හුදී ජනී ජනයා විහාරස්ථානයට යළි ආකර්ෂණය කොට ගැනීමටත් උන්වහන්සේ කල්පනා කළෝය.

එම ව්‍යාපෘතියෙහි ලා මුන් වහන්සේ පළමුව සිදු කළේ තමන් වහන්සේ ආදර්ශයෙන් මඟ පෙන්වීමයි.

සැබෑ ලෙසම උන් වහන්සේ ථෙරවාද භික්ෂු සම්ප්‍රදාය මූර්තිමත් කළ ආදර්ශ පිණ්ඩයක් විය. ඒ සඳහා අවශ්‍ය කරන, වේරගම්පිට රේවත මාහිමියන්ගෙන් ලබා ගත් ආකල්ප සම්පත්තියෙන් ද විද්‍යෝදය පිරිවෙනින් හා හික්කඩුවේ සුමංගල මාහිමියන්වහන්සේ වැනි ශ්‍රේෂ්ඨ ගුරුවරුන්ගෙන් ලබාගත් විෂයීය ඥානයෙන් ද සසරින්ම ආ මහත් පූර්ව කෘත පුණ්‍ය බලයෙන් ද උන්වහන්සේ පරිසමාප්ත විය. ඒ සියල්ල එකට එකලස් වූ කළ මිහිපිට අසිරියක් මැ සිදුවීම අරුමයක් නොවේ.

දෙවනුව උන් වහන්සේ තම ශාසනික කාර්යාවලිය වඩාත් පුළුල්ව පැතිරවීමට හැකි හා එය පහසුවෙන් ඇකීමැකී යා නොහෙන පරිදි ආදර්ශවත් විහාරාරාමයක් ද පිළිවෙත් සරු සිසු පිරිසක් ද තනා ගත්හ. බම්බලපිටියේ සිරි වජිරාරාමය ඒ අසිරිමත් පුණ්‍ය භූමිය යි. සමකාලීනව මතුනොව එකල සිට මෙකල දක්වාම එකම විහාරස්ථානයකින් එකම ආචාර්යයන් වහන්සේ නමක් ඇසුරින් මෙබඳු ශිෂ්‍ය භික්ෂු පිරිසක් බිහි නොවූ තරම් ය. උන් වහන්සේලා එක නමකට එක නමක් දෙවනි නොවන සේ සිය ආචාර්යයන් වහන්සේ ගත් මඟ වඩ වඩාත් උද්දීප්ත කළෝය.

වජිරාරාමයට පැවැරුණු ප්‍රමුඛතම අභියෝගයක් වුයේ බිහිවෙමින් පැවති මෙම නවීන සමාජයට බුදු දහම ගෙනයාමයි. රාත්‍රී පහන්වන තුරු පුස්කොළ පොත කියවමින් සිදු කළ ධර්ම දේශනා සම්ප්‍රදාය ඇල්මැරුණු ස්වභාවයක් ගත් අතර මෙකල ධර්මපාලතුමන්ගේ උණුසුම් වාග් වින්‍යාසය ධර්ම දේශනාවට වඩා ප්‍රබලව

ගම් දනවු සිසාරා පැතිර යමින් තිබිණි. විද්‍යෝදය පිරිවෙනේ මහගොඩ ඥානිස්සර නා හිමියන් වදාළ පරිදි පැළෑණේ මහ නා සමිඳුන්ට බණ කියන පැලෑණ හමුවිය. උන් වහන්සේ රාත්‍රී පහන් වන තුරු දෙසන බණ දෙසුම වෙනුවට පැයෙක කාලයකට ධර්ම දේශනාව සීමා කොටගෙන එක් ධර්ම මාතෘකාවක් උද්ධෘත කොට ගනිමින් පවත්වන ඍජු දේශනා විලාසයක් අනුගමනය කළෝය. මෙම ධර්ම දේශනා වේගයෙන් ප්‍රචලිත වූ අතර බණ ඇසීමට දහස් ගණන් ජනී ජනයා පැමිණෙන්නට විය. කල් යත්ම ගුවන් විදුලිය ඔස්සේ ද මෙම ධර්ම දේශනා විකාශය විය. ප්‍රථම ගුවන් විදුල් ධර්ම දේශනාව උන් වහන්සේගේ වූ අතර පසු කලෙක ප්‍රථම රූපවාහිනී ධර්ම දේශනාව සිදු කරන්නේ ද උන් වහන්සේගේ ශිෂ්‍ය පියදස්සී මාහිමියන් විසිනි. ඉංග්‍රීසිය නවීන ලෞකිකත්වයේ ලකුණක් ලෙස සලකා සිය ශිෂ්‍යයින්ට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබාදීමට පැරණි මහ තෙරුන් වහන්සේලා පසුබට වූ යුගයක ඊට වඩා වෙනස් අදහසක් දරමින් සිය ශිෂ්‍ය භික්ෂූන්ට ඉංග්‍රීසි අධ්‍යාපනය ලබා දීමටත් ඉංග්‍රීසිය මාධ්‍ය කොට ගත් ධර්ම දේශනා සම්ප්‍රදායක් ඇති කිරීමටත් උන් වහන්සේ සමත් විය. ඉංග්‍රීසි උගත් කොළඹ සමාජය දහමින් ආමන්ත්‍රණය කිරීමේ ප්‍රබලම මාධ්‍ය පිළිබඳ උන් වහන්සේ අවබෝධයෙන් හුන් සේක. පසු කලෙක අපරදිගට බුදුදහම සන්නිවේදනය කිරීමෙහි ලා ප්‍රමුඛතම භික්ෂූන් වහන්සේ බවට පත්වුයේ පැළෑණේ මහ මහ නා හිමියන්ගේ ජ්‍යෙෂ්ඨතම ශිෂ්‍ය නාරද මාහිමිපාණන් වහන්සේය. ඉංග්‍රීසි ජාතික ඤාණවීර ඤාණමෝලි වැනි

ශිෂ්‍ය හිමිවරු වජිරාරාමයේ පැවදි වීම මෙම සේවාව වඩාත් පුළුල් වීමට හේතු විය. පොහොය දින නිවාඩුව රජය මඟින් අනුමත කිරීමට පූර්වයෙහි පටන්ම ක්‍රමවත් පෝය වැඩ සටහනක් වජිරාරාමය මඟින් ක්‍රියාත්මක කරන ලදී. ඒ පොහොය යෙදෙන සති අන්ත නිවාඩු දිනයක් ඇසුරු කොට ගනිමිනි. අද වන විට එම ආදර්ශ ආකෘතිය සෑම විහාරස්ථානයකටම පොදු ලක්ෂණයක් වීම ම එහි සාර්ථකත්වයට දෙස් දෙයි. දේශපාලන ක්ෂේත්‍රයට නොබැස දේශපාලඥයින්ට දහමින් අනුශාසනා කිරීම ප්‍රතිපත්තිය කොටගත් පැළෑණේ මහ නා හිමියන් ප්‍රමුඛ වජිරාරාම භික්ෂූන්ගේ සිරිත වඩා පුළුල් භාවිතාවකට ගෙන ගියාහු උන් වහන්සේගේ ශිෂ්‍ය මඩිහේ මහ නා හිමිපාණෝය. උන් වහන්සේ දේශපාලඥයින්ට සිදු කළ සියුම් අනුශාසනා මඟින් ලාංකේය සමාජයට අත් වූ ප්‍රතිලාභයන් නම් සියුම් නොවේ. පැළෑණේ මහ නා හිමියන් ප්‍රධාන වජිරාරාමවාසී භික්ෂූහු මේ සියල්ල මෙසේ සිදු කරන ලද්දේ ප්‍රාතිමෝක්ෂ ශික්ෂා පදවලට ඇති ගෞරවය බිඳකුදු ඉක්මවා නොවේ. එම ශික්ෂාවට කෙතරම් ගරුසරු වූයේ ද යත් අතිශය කාර්යබහුල බම්බලපිටිය නගරාශ්‍රිතව පාරිශුද්ධ සීමා සම්මතයක් සිදුකිරීම පිළිබඳ ගැටලු තිබු නමුත් සෑම අඩ මසකට වරක් වජිරාරාම භික්ෂූන් පොහොය විනය කර්මාදිය කිරීම අතපසු නොකරන ලද්දේ බම්බලපිටියේ වෙරළ තීරයට බැස අපහසුකම් ඉවසා පෝය විනය කර්ම කරමිනි.

පැළෑණේ මහ නායක මා හිමිපාණන් වහන්සේ සේ ම එකම කාල වකවානුවක දී උගත් ප්‍රභූ පවුලක

ඉපිද, උන්වහන්සේ සේම සිය පවුලේ සමීපතමයෙකුගේ වියෝවෙන් කම්පිතව ගිහිගෙයින් නික්මැ, බ්‍රහ්මචාරීව, උන්වහන්සේ සේම යටත් විජිත අඳුරු සමයෙහි දැයත් සසුනත් වෙනුවෙන් සිය ජීවිතය කැප කළ, නමුත් උන් වහන්සේට වඩා සාකල්‍යයෙන්ම වෙනස් මඟක් ගත් යුග පුරුෂයකු වූ ශ්‍රීමත් අනගාරික ධර්මපාලතුමන්ගේ 150 වෙනි ජන්ම සංවත්සරයත් පැළෑණේ මහානායක මාහිමිපාණන්ගේ 60 වන ගුණ සමරුවත් එකට එක්ව යෙදෙනා මේ සාරාණීය අවස්ථාවෙහි දී දන් දී පින් අනුමෝදන් කරන්නා සේම ඊටත් වඩා පෘථුල කෘතෝපහාරයක අවශ්‍යතාවය අප යෝජනා කරනු කැමැත්තෙමු. එනම් නව යුගයෙහි ජාතික ශාසනික අවශ්‍යතාවය මනාව හඳුනා ගතහැකි සාරපූර්ණ මිනිසුන් විසින් ඒ අවශ්‍යතාවයන් සැපිරීම උදෙසා සිය ජීවිතය අකලංකව කැප කිරීමයි. එය පූර්වෝක්ත යුග පුරුෂයන් දෙපළටම කරන මහත්ම උපහාරය වනු ඇත.

හරසර ලබන සුසිරිත් දහමෙහි නියුතා
පරපුර නඟා සිටුවන පෙර නිමිති යුතා
පෙර වර බසුත් සතරත් දහමුත් උගතා
හරබර ගුණ නුවණ ඇතියේ ය හොඳ පුතා

**(පැළෑණේ සිරිවිදුරුනැණ මහ නාහිමි)**

## සූත්‍ර පිටකයෙන්....

මහණෙනි, අඩමසෙහි අටවක් දින සතරවරම් මහරජුන් ගේ ඇමතිවරු මිනිස්ලොව මිනිසුන් මිනිසුන් අතර බොහෝ මිනිස්සු මවුවරුන් පුදන්නාහු ද, පියවරුන් පුදන්නාහු ද, මහණුන්, බමුණන්, කුලදෙටුවන් පුදන්නාහු ද, පෙහෙවස් වෙසෙත් ද, පොහොය නිදිවරා වෙසෙද්ද, පින් කෙරෙත්දැ යි බලමින් මෙලොව වටා හැසිරෙති.

මහණෙනි, අඩමස තුදුස්වක්හි සතරවරම් මහරජුන් ගේ පුත්‍රයෝ ලෝකයේ බොහෝ මිනිස්සු මවුවරුන් පුදන්නෝ ද පියවරුන් පුදන්නෝ ද, මහණුන්, බමුණන්, කුලදෙටුවන් පුදන්නෝ ද, පෙහෙවස් වෙසෙත් ද, පොහොය නිදිවරා වෙසෙද්ද, පින් කෙරෙත්දැ යි බලමින් මෙලොව වටා හැසිරෙති.

පසළොස්වක පොහෝ දින සතරවරම් මහරජවරු තුමූ ම මේ ලෝකයේ බොහෝ මිනිස්සු මවුවරුන් පුදන්නෝ ද පියවරුන් පුදන්නෝ ද, මහණුන්, බමුණන්, කුලදෙටුවන් පුදන්නෝ ද, පෙහෙවස් වෙසෙත් ද, පොහොය නිදිවරා වෙසෙද්ද, පින් කෙරෙත්දැ යි බලමින් මෙලොව වටා හැසිරෙති.

මහණෙනි මිනිසුන් අතර මවුවරුන් පුදන්නෝ ද පියවරුන් පුදන්නෝ ද, මහණුන්, බමුණන්, කුලදෙටුවන් පුදන්නෝ ද, පෙහෙවස් වෙසෙන්නෝ ද, පොහොය නිදිවරා වෙසෙන්නෝ ද, පින් කරන්නෝ ද ස්වල්ප වෙත් නම් සතරවරම් මහරජවරු තව්තිසාවෙහි සුධර්මා සභාවෙහි රැස්ව හුන් දෙවියන්ට ඒ කරුණ දැනුම් දෙති.

එයින්, තව්තිසා වැසි දෙවියෝ දෙව් පිරිස්හි පිරිහීමක්, අසුර පිරිස්හි වැඩීමත් සලකා නොසතුටු වන්නාහු ය.

මහණෙනි, මිනිසුන් අතර මවුවරුන් පුදන්නෝ ද පියවරුන් පුදන්නෝ ද, මහණුන්, බමුණන්, කුලදෙටුවන් පුදන්නෝ ද, පෙහෙවස් වෙසෙන්නෝ ද, පොහොය නිදිවරා වෙසෙන්නෝ ද, පින් කරන්නෝ ද බොහෝ වෙත් නම් සතරවරම් මහරජවරු තව්තිසාවෙහි සුධර්මා සභාවෙහි රැස්ව හුන් දෙවියන්ට ඒ කරුණ දැනුම් දෙති. එයින්, තව්තිසා වැසි දෙවියෝ දෙව් පිරිස්හි වැඩිවීමත්, අසුර පිරිස්හි පිරිහීමත් සලකා සතුටු වන්නාහු ය.

**(අංගුත්තර නිකාය - තික නිපාතය)**